# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No } 10120 2171635

ෆැක්ස්
தொலைநகல
Fax } 011-

දුරකථන
தொலைபேசி
Telephone } 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site } www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail } dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO } 1058 /2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No } / 2024

දිනය
திக
Date } 25/06/2024 පැය 1430

## මාධ්‍ය නිවේදනය

### 01. හෙරොයින් සමඟ අත්අඩංගුවට ගත් සැකකරුගෙන් වැඩිදුර විමර්ශනයේදී ජීව අත්බෝම්බයක් සොයා ගැනීම - බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය.

2024.06.19 වන දින කඩවත පොලිස් වසමේදී බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් **යුක්තිය මෙහෙයුමට සමගාමීව සිදු කරන ලද වැටලීමකදී හෙරොයින් ග්‍රෑම් 16 මිලි ග්‍රෑම් 520 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන රැඳවුම් නියෝග ලබා ගනිමින් වැඩිදුර විමර්ශන ආරම්භ කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන කැළණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

රැඳවුම් නියෝග මත සැකකරුගෙන් සිදුකරන ලද වැඩිදුර ප්‍රශ්න කිරීමේදී 2023.12.14 වන දින රාගම පොලිස් වසමේදී වෙඩි තබා පුද්ගලයෙකු ඝාතනය කිරීම සහ දෙදෙනෙකුට තුවාල සිදු කිරීමේ සිද්ධියට අදාල වෙඩික්කරු බවට අනාවරණය වී ඇත. සැකකරු කඩවත පොලිස් වසමේ ඉහල බියන්විල ප්‍රදේශයේ තාවකාලිකව පදිංචිව සිටි කාමරයක් බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් පරීක්ෂාවට ලක් කර ඇති අතර කාමරය තුල තිබී **විදේශ රටක නිෂ්පාදිත ජීව අත්බෝම්බයක්** සොයා ගෙන ඇත.

සැකකරු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. මාරක රිය අනතුරක් - දිවුලපිටිය පොලිස් වසම.

2024.06.24 වන දින උදෑසන කාලයේදී දිවුලපිටිය පොලිස් වසමේ දිවුලපිටිය මීගමුව මාර්ගයේ කඩවල ප්‍රදේශයේදී මීගමුව දෙස සිට දිවුලපිටිය දෙසට

ධාවනය කල ත්‍රීරෝද රථයක් රියදුරුට පාලනය කර ගැනීමට නොහැකිවී මාර්ගයෙන් ඉවතට පැන දුරකතන රැහැන් කණුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ ත්‍රීරෝද රථයේ රියදුරු, පසුපස ගමන්ගත් රියදුරුගේ දියණිය හා බිරිඳගේ මව තුවාල ලබා මීගමුව රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී දියණිය මියගොස් ඇත. රියදුරු වැඩිදුර ප්‍රතිකාර සඳහා කොළඹ ජාතික රෝහල වෙත මාරුකර යවා ඇත.

**මියගිය දියණිය වයස අවුරුදු 1 ½ ක් වන කඩවල, දූනගහ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

දිවුලපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - දොඩන්ගොඩ පොලිස් වසම.

2024.06.24 වන දින සවස් කාලයේදී දොඩන්ගොඩ පොලිස් වසමේ කළුතර මතුගම ප්‍රධාන මාර්ගයේ රේන්දපල ප්‍රදේශයේදී මාර්ගයේ ගමන් කරමින් සිටි දැරියන් දෙදෙනෙකු කළුතර දෙස සිට මතුගම දෙසට ධාවනය කල ත්‍රීරෝද රථයක ඉදිරිපස ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් එම දැරියන් දෙදෙනා බරපතල තුවාල ලබා නාගොඩ රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී එක් දැරියක් මියගොස් ඇත.

**මියගිය දැරිය වයස අවුරුදු 09 ක් වන දොඩන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකාරියකි. අවුරුදු 14 ක් වන අනෙක් දැරිය නේවාසිකව ප්‍රතිකාර ලබයි.**

මෘත ශරීරය නාගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් ත්‍රීරෝද රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර දොඩන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - මුරුන්කන් පොලිස් වසම.

2024.06.24 වන දින සවස් කාලයේදී මුරුන්කන් පොලිස් වසමේ තලෛමන්නාරම මැදවච්චිය ප්‍රධාන මාර්ගයේ මුරුන්කන් ප්‍රදේශයේදී මැදවච්චිය දෙස සිට මන්නාරම දෙසට ධාවනය වූ යතුරු පැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි බස් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පැදිකරු මුරුන්කන් රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මිය ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 31 ක් වන නාගසෙට්ටි, නානාට්ටාන් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මුරුන්කන් රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර මුරුන්කන් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.06.24 වන දින ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක්

**සිදුකර හෙරොයින් ග්‍රෑම් 07 මිලිග්‍රෑම් 760 ක් සන්තකයේ තබාගෙන සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**